# දැක්ම

රටේ ප්‍රධානතම විදේශ
විනිමය උපයන
ආයතනයක් වීම




# මෙහෙවර

සමාගමට ලබා ගත හැකි
සියළු වෙරළාශ්‍රිත බර
ඛණිජ වැලි වර්ග සහ
වෙනත් ස්වාභාවික සම්පත්
වල අගය ප්‍රශස්ථ
මට්ටමින් වැඩි කිරීම

# අන්තර්ගතය


| | |
|---|---|
| ආයතනික තොරතුරු | 01 - 02 |
| නිසි බලධාරියාගේ පණිවුඩය | 03 |
| නිසි බලධාරියාගේ වාර්තාව | 04 - 07 |
| වැදගත් මූල්‍ය තොරතුරු | 08 |
| විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව | 09 |
| විගණකාධිපතිතුමාගේ වාර්තාව | 10 - 13 |
| මූල්‍ය ප්‍රකාශන | 14 - 44 |

# ආයතනික තොරතුරු

| | | |
|---|---|---|
| නම | : | ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් |
| නෛතික ස්වභාවය | : | පූර්ණ වශයෙන් ශ්‍රී ලංකා රජයට අයත් සීමාසහිත සමාගමකි. |
| සමාගම් ලියාපදිංචි අංකය | : | PB 587 |
| ලියාපදිංචි කාර්යාලය | : | අංක 341/21, සරණ මාවත, රාජගිරිය |
| නිසි බලධාරියා | : | ටී. අශෝක පීරිස් මහතා<br>B.A. Hons Economics (පේරාදෙනිය)<br>M.S.S.C (කැලණිය) |
| කළමණාකාර කණ්ඩායම | : | එස්. ඥානේස්වරන් මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යන්ත්‍රාගාර/මෙහෙයුම්)<br>B.Sc.Eng.,<br>ඉංජිනේරු ආයතනය<br>ආශ්‍රිත සාමාජිකයෙකි |
| | | එල්. එස්. අබේරත්න මහතා - වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන)<br>මූල්‍ය හා ගණකාධිකරණ (විශේෂ) |
| | | ඩබ්ලිව්.කේ. තමාරා මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)<br>L.I.C.A, APFA |
| | | එම්. ඒ.අයි.පී. ජයතිලක මහතා - ප්‍රධාන අභ්‍යන්තර විගණක<br>L.I.C.A. |
| | | ඩබ්ලිව්. ඩබ්ලිව්.ඩී. ඩබ්ලිව්. කුමාර මහතා - සැපයුම් කළමනාකරු<br>B.Sc. |
| | | පී.බී.එම්.විජේබණ්ඩාර මහතා - අලෙවි කළමනාකරු<br>B.Sc. |

# ආයතනික තොරතුරු

| | | |
|---|---|---|
| විගණකවරු | : | විගණකාධිපතිවරයා වෙනුවට<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව,<br>පොල්දූව පාර,<br>බත්තරමුල්ල. |
| බැංකුකරුවෝ | : | ලංකා බැංකුව<br>මහජන බැංකුව<br>හැටන් නැෂනල් බැංකුව |
| ලේකම්වරු | : | සීමාසහිත පී. ඩබ්ලිව්. කෝපරේට් සෙකටේරියල් (පුද්ගලික) සමාගම,<br>3/17, කින්සි පාර,<br>කොළඹ 08. |

# නිසි බලධාරියාගේ පණිවුඩය

මම ඉමහත් ප්‍රීතියෙන් යුක්තව 2016 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම පූර්න වශයෙන් ශ්‍රී ලංකා රජයට අයත් සීමාසහිත සමාගමක් වන අතර, කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ නියාමනයන්ට යටත්ව අඛණ්ඩ පැවැත්මක් යටතේ ක්‍රියාත්මක වන වඩාත් සාර්ථක සමාගමකි.

වර්ෂය තුළ විකුණුම් වටිනාකම රු. මිලියන 1,174 ක් වන අතර, රු.මිලියන 154 ක බදු පෙර ශුද්ධ ලාභයක් ඉපැයීමට සමත් වී ඇත.

වර්ෂය අවසාන සේවක සංඛ්‍යාව 685 කි. වැඩමුළු, සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩ සටහන් පවත්වන ලදී. එමගින් සේවකයන්ට කර්මාන්තය පිළිබඳව වටිනා දැණුම ලබා ගැනීමට හැකියාව ලබාදී ඇත.

ඛනිජ සම්පත් කැනීම හා නව යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනිම තුළින් සමාගමේ නිෂ්පාදනය වැඩිකර ගැනීම හා එමගින් ආදායම වැඩිකර ගැනීමට අපේක්ෂා කරයි.

ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම විසින් අඛණ්ඩව මුදල් උත්පාදනය කර ඇති අතර එම ක්‍රියාවලිය දිගින් දිගටම පවත්වාගෙන යාමට සමාගමට විශ්වාසයක් ඇත.

අගය එකතු කිරීම යනු අපගේ ප්‍රධාන අභිප්‍රාය වන අතර ඊළඟ වසරේදී ඉලක්ක ගත ඉලක්කයන් සපුරා ගැනීමට අප විශ්වාස කරමු.

අපේක්ෂිත අරමුණු ඉටුකිරීමෙහි ලා කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා, ලේකම් සහ කාර්ය මණ්ඩලය විසින් ලබා දුන් සහයෝගය සහ අනුබලය ඉතා අගය කොට සලකමි.

අප ළඟා කරගත් ඉලක්ක සඳහා දායකත්වය ලබාදුන් ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගමේ කාර්ය මණ්ඩලයටද මාගේ ස්තුතිය පුද කරමි..

එම්. ගුණරත්න
නිසි බලධාරි.

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි නිසි බළධාරියා විසින් ඔහුගේ වාර්තාව, 2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කල මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව සමග ඉදිරිපත් කරනු ලැබේ.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

ලංකා මිනරල් සෑන්ඩ්ස් හි සාංගමික සංස්ථාවලිය හා සාංගමික ව්‍යවස්ථාවලියෙහි දැක්වෙන අරමුණු:-

1. බර ඛණිජ වැලි කැණීම්,වෙන් කිරීම්, පිරිපහදුව හා සැකසුම
2. වෙරළාශ්‍රිත බර ඛණිජ වැලි උපයෝගී කරගෙන වාණිජමය හෝ කාර්මික වටිනාකමක් ඇති ද්‍රව්‍ය හෝ ඒ ආශ්‍රයෙන් නිපදවිය හැකි කුමන හෝ ද්‍රව්‍යයන් නිපදවීම

සහ

3. වෙරළාශ්‍රිත බර ඛණිජ වැලි පිරි පහදුවේදී හෝ සැකසීමේ ප්‍රතිඵලයක් ලෙස නිපදවන කුමන හෝ අතුරු ද්‍රව්‍ය නිෂ්පාදනය හා අලෙවිය.

## නිෂ්පාදනය

මෙම වර්ෂයේ නිෂ්පාදනයන්හි විස්තර පහත සඳහන් පරිදි වේ.

| | මෙට්‍රික් ටොන් |
|---|---|
| ඉල්මනයිට් | 22,890 |
| රූටයිල් | 2,237 |
| සර්කෝන් | 628 |
| හයි. ටයි. ඉල්මනයිට් | 3,269 |
| නන් මැග්නටික් ටේලින්ස් | 9,000 |
| ස්පයිරල් ෆයින් කොන්සන්ට්‍රේට් | 226 |
| සර්කෝන් ක්රෑඩ් | 2,788 |
| ඉහළ ශ්‍රේණිය - සර්කෝන් ක්රෑඩ් | 2,996 |
| පහළ ශ්‍රේණිය - සර්කෝන් ක්රෑඩ් | 1,337 |
| ක්රෑඩ් මොනසයිට් | 21 |
| | 45,392 |

## විකුණුම්

ඛණිජ වැලි මෙට්‍රික් ටොන් 60,925 ක් අලෙවියෙන් රු.මි. 1,174 ක ආදායමක් උපයා ඇත.

| | මෙට්‍රික් ටොන් | රු.මිලියන |
|---|---|---|
| ඉල්මනයිට් | 31,004 | 211 |
| රූටයිල් | 2,121 | 216 |
| සර්කෝන් | 294 | 31 |
| හයි.ටයි.ඉල්මනයිට් | 3,000 | 28 |
| ස්පයිරල් ෆයින් කොන්සන්ට්‍රේට් | 2,900 | 132 |
| නන් මැග්නටික් ටේලින්ස් | 9000 | 191 |
| සර්කෝන් ක්රෑඩ් | 7,363 | 230 |
| සර්කෝන් ක්රෑඩ් – ඉහළ ශ්‍රේණිය | 1,975 | 90 |
| සර්කෝන් ක්රෑඩ් – පහළ ශ්‍රේණිය | 2,868 | 4 |
| ක්රෑඩ් මොනසයිට් | 400 | 41 |
| | 60,925 | 1,174 |

## ප්‍රතිඵල හා ලාභාංශ

සමාගමේ බදු පසු ලාභය රු.මි.154 කි. රු.මි. 305 ක් වූ අවශෝෂණය නොකල යන්ත්‍රාගාර පොදුකාර්ය පිරිවැය නොවන්නට උක්ත ප්‍රකාශිත ලාභය තවදුරටත් ඉහළ යනු ඇත. සීමිත නිෂ්පාදනයෙහි සහ පුල්මුඩේ ප්‍රදේශයෙන් සෑපු නැව්ගත කිරීම් නොමැති වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම අන්තර්ග්‍රහණය නොකරන ලද පොදුකාර්ය වියදම් ඇතිවිය.

රුපියල් මිලියන 53.9 ක මුදලක් ලාභාංශ වශයෙන් වෙන්කරන ලදී.

රු.මි.

| | 2016 | 2015 |
|---|---|---|
| දළ ආදායම | 1,174 | 1,688 |
| දළ ලාභය | 607 | 821 |
| ශුද්ධ ලාභය | 154 | 457 |

## දේපළ, පිරියත හා උපකරණ

සටහන් අංක 12 හි විස්තරවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණවල ලියාහල අගය එහි මූලික පිරිවැය වූ රු. මිලියන 1,186න් සියයට 43 ක් (43 %) පමණ විය. කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල අගය මිලියන 245 කි. මෙය යන්ත්‍ර හා යන්ත්‍රාගාර වැඩි දියුණු කිරීම හා නැවත සැකසීම සඳහා වූ පැහැදිලි දර්ශකයක් වේ.

ස්ථාවර වත්කම් වලට වර්ෂය තුළ එකතු කිරීම් රු. මිලියන 7 ක් විය.

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

කොටස් මිලියන 80 කින් සමන්විත රු.මි. 800 ක ප්‍රකාශිත ප්‍රාග්ධනය නොවෙනස්ව පැවතුනු අතර, භාණ්ඩාගාර ලේකම් විසින් සියළුම කොටස් දරයි. විස්තර සටහන් අංක 24 හා සම්බන්ධ වේ.

## සංචිත සහ රඳවාගත් ලාභය

රු.මි. 111 ක් මෙහෙයුම් වල නොපවතින පාවෙන යාත්‍රා සංචිත වලින් මාරු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස රු.මි. 111 කින් රඳවාගත් ලාභ වර්ධනය විය.

## කෙටිකාලීන මූල්‍ය වත්කම්

කෙටි කාලීන මූල්‍ය වත්කම් රු.මි. 209 සිට රු.මි. 19 දක්වා අඩු විය.

## බදුකරණය

වර්ෂයේ සාමාන්‍ය බදු ප්‍රතිශතය 28% කි. කෙසේ වුවත් අපනයන සඳහා 12% ක සහන බදු ප්‍රතිශතයක් සමාගම භුක්ති විඳී.

## කොටස් තොරතුරු

කොටසක මූලික ඉපයීම රු.1.93 කි.

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශිත දිනට පසුව ඇතිවූ සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දින සිට ගැලපීමක් අවශ්‍ය වන කිසිඳු සිදුවීමක් උද්ගත වී නොමැත.

## රැකියා ප්‍රතිපත්ති

2016.12.31 වන දිනට සේවකයින් සංඛ්‍යාව 685 ක් විය. සලකා බලන වර්ෂය තුළදී කළමනාකරණය විසින් මානව සම්පත් කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණ මගින් සේවකයින් පුහුණු කිරීම 2016 වර්ෂය තුළදී ද ඉදිරියට ගෙන එන ලදී.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

නිසි බලධාරියාගේ දැනුම සහ විශ්වාසයට අනුව සේවකයින්ට සහ රජයට සම්බන්ධ සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් අදාල දිනට නිම කර ඇති බවට සෑහීමකට පත් විය හැකිය.

## අධ්‍යක්ෂක මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම 29.09.2015 දින සිට බල පැවැත්වෙන පරිදි නිසි බලධාරියා වෙත මාරු කර ඇත.

ටී. අශෝක පීරිස් මහතා - ( 29.09.2015 සිට 07.02.2017 දක්වා)

## අනාගත සැලසුම්

සමාගමේ අනාගත සැලසුම් නම්,

- ❖ නව නිෂ්පාදිත හා ස්ථාන විවිධාංගිකරණය කිරීම.
- ❖ අගය එකතු කරන නිෂ්පාදිත ව්‍යාප්ත කිරීම.
- ❖ කෝකිලායි උතුරු ප්‍රදේශයේ සර්පිලාකාර ගුරුත්වාකර්ෂණ මධ්‍යස්ථානය පිහිටුවීම.
- ❖ ඒකක 12 ක් වූ තෙමහල් කාර්ය මණ්ඩල නේවාසිකාගාර ඉදි කිරීමේ කටයුතු නිම කිරීම.
- ❖ කාර්ය මණ්ඩල නිළ නිවාස අළුත්වැඩියා කිරීම.
- ❖ සේවකයින්ගේ සුභ සාධන පහසුකම් වැඩිදියුණු කිරීම.
- ❖ පුල්මුඩේ පිහිටි යාන් ඔය ජල පෝෂක ප්‍රදේශයේ සිට අයි.ආර්.ඉසඩ් යන්ත්‍රය දක්වා වූ යෝජිත ජල සම්ප්‍රේෂණ නල මාර්ගය සඳහා පී.ඊ නල එලීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම.
- ❖ අභ්‍යන්තර විදුලි බෙදාහැරීමේ පද්ධතිය අළුත්වැඩියා කිරීම.
- ❖ දැනට පවතින හානි වූ ගබඩා අළුත්වැඩියා කිරීම.
- ❖ රූටයිල් කර්මාන්ත ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම.
- ❖ වෙරළ ආශ්‍රිතව පවතින පොල් වගාව සහ නිවාස යෝජනා ක්‍රමය ආරක්ෂා කිරීම සඳහා ගැබින් තාප්පය ඉදි කිරීම
- ❖ වියලි සර්කොන් බලාගාර සඳහා ෆ්ලූඩිසයිඩ් බෙඩ් ඩ්‍රයර් සවි කිරීම.
- ❖ පවත්නා යන්ත්‍රාගාර සංකීර්ණය ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම.
- ❖ අන්තර්ජාතිකව පිළිගත් ප්‍රමිතීන් වලට අනුව රසායනාගාරය වැඩිදියුණු කිරීම.
- ❖ තෙත අධික තීව්‍රතාවයකින් යුත් චුම්බක වෙන් කිරීමේ බලාගාරය ප්‍රතිසංස්කරණය කිරීම.
- ❖ සිවිල් යාත්‍රික විද්‍යුත් වැඩපොළ යාවත්කාලීන කිරීම.
- ❖ සර්කෝන් නිෂ්පාදනය වැඩිකිරීම සඳහා තෙත් සිලින්ඩරය තුල වෙට් ටේබල්ස් 09 ක් ප්‍රතිස්ථාපනය කිරීම.
- ❖ "ඒ" කාණ්ඩයේ ජල සම්ප්‍රේෂණ මාර්ගය වෙනස් කිරීම
- ❖ වෙට් ග්‍රැවිටි අප්ග්‍රේඩින් ප්ලාන්ට් හි සහ වෙට් මිල් ස්පයිරල් ටේලින්ස් හි ටේලින්ස් වැඩි දියුණු කිරීමට සර්පිලාකාර ගුරුත්වාකර්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම

## නිසි බලධාරිගේ කොටස් හිමිකම

නිසි බලධාරි විසින් සමාගමේ කිසිදු කොටසක් සඳහා හිමිකමක් නොදරයි. මුළු කොටස් හිමිකම (100 %) මහා භාණ්ඩාගාරයේ ලේකම් සතුවේ.

## සංස්ථාපිත සමාජ වගකීම

සංස්ථාපිත සමාජ වගකීම් ඉටුකිරීම සඳහා සමාගම විසින් රු.59,000.00 ක් වැය කර ඇත. සමාජ සුභසාධන කටයුතු සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම, ආගමික කටයුතු, අධ්‍යාපනික කටයුතු ආදිය මේ යටතේ සිදුකර ඇත.

## ගිවිසුම් පිළිබඳ නිසි බලධාරියාගේ බැඳියාව

සමාගම සමග ඇතිකරගත් කිසිදු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුම් තුළ නිසි බලධාරිගේ සෘජු හෝ වක්‍ර බැඳීමක් නොමැත.

## සාංගමික යහපාලනය/අභ්‍යන්තර පාලනය

සමාගමෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ වගකීම නිසි බලධාරි විසින් දරනු ලබයි. වත්කම් ආරක්ෂා කිරීම, උචිත ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සහ විශ්වාසනීය මූල්‍ය තොරතුරු උත්පාදනය සහතික කිරීම සඳහා සමාගමේ පාලන පද්ධතිය නිර්මාණය කර ඇත. කෙසේ වුවත්, කිසිදු ඕනෑම පද්ධතියකට හැකි වන්නේ සාධාරණ සහතික කිරීමක් ලබාදීම පමණක් වන අතර, වැරදි හා අක්‍රමිකතා වැළැක්වීම හෝ සාධාරණ කාලයක් තුළ ඒවා හඳුනා ගැනීම පිළිබඳ නිරපේක්ෂ සහතිකයක් ලබා දිය නොහැක.

මූල්‍ය ප්‍රකාශන කට්ටලය අත්සන් තබන දින දක්වා අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යක්ෂමතාව පිළිබඳව නිසි බලධාරියා සෑහීමකට පත්වේ.

## අඛණ්ඩ පැවැත්ම

නිසි බලධාරි විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම උපයෝගී කරගෙන ඇත.

## විගණකවරුන්

2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වසර සඳහා බාහිර විගණකවරුන් ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

## ලේකම්වරුන්

සීමාසහිත පී. ඩබ්ලිව් කෝපරේට් සෙකටේරියල් (පෞද්ගලික) සමාගම ලේකම්වරුන් ලෙස තව දුරටත් කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
පී. ඩබ්ලිව් කෝපරේට් සෙකටේරියල්
(පෞද්ගලික) සමාගම,
ලේකම්වරු.

# පසුගිය වර්ෂ පහ සඳහා වැදගත් මූල්‍ය තොරතුරු

| | | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|
| දළ විකුණුම් ආදායම | - රු.මි. | 1,985 | 679 | 1,220 | 1,688 | 1,174 |
| දළ ලාභය | - රු.මි. | 1,628 | 500 | 694 | 821 | 607 |
| වෙනත් ආදායම් | - රු.මි. | 224 | 56 | 56 | 136 | 55 |
| බද්දට පෙර ලාභය | - රු.මි. | 1,373 | 30 | 328 | 503 | 170 |
| බද්දට පසු ලාභය | - රු.මි. | 1,190 | 20 | 329 | 457 | 154 |
| අන්තර්ග්‍රහනය නොකල පොදුකාර්ය වියදම් | - රු.මි. | 292 | 358 | 259 | 277 | 305 |
| මුළු වත්කම් | - රු.මි. | 2,029 | 2,400 | 2,829 | 2,764 | 3,100 |
| මුළු වගකීම් | - රු.මි. | 249 | 715 | 847 | 489 | 556 |
| කොටස් හිමියන්ගේ හිමිකම් | - රු.මි. | 1,780 | 1,684 | 1,981 | 2,276 | 2,544 |
| ආදායම් බදු | - රු.මි. | 182 | 10 | (2) | 46 | 16 |
| මහා භාණ්ඩාගාරයට ලාභාංශ | - රු.මි. | 1,700 | 43 | 14 | 158.5 | 54 |
| සේවක සංඛ්‍යාව | | 595 | 629 | 636 | 847 | 685 |
| බද්දට පෙර ශුද්ධ ලාභය හිමිකමේ ප්‍රතිශතයක් ලෙස | | 77% | 2% | 17% | 22% | 7% |
| බද්දට පෙර ශුද්ධ ලාභය මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | | 68% | 1% | 12% | 18% | 5% |
| ජංගම අනුපාතය | | 5:1 | 2:1 | 2:1 | 4:1 | 4:1 |

# විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් සමාගම සමස්ත 2016 වර්ෂයේදී නිසි බලධාරියා යටතේ ක්‍රියාත්මක වී ඇත.

මෙහි අධ්‍යක්ෂක මණ්ඩලයක් නොමැති අතර එම නිසා විගණන හා කළමනාකාරන කමිටුව සඳහා පත්කිරීම් සිදුකර නොමැත.

රේඛීය ලේකම් අමාත්‍යාංශයේ නිර්දේශයන් මත පදනම්ව විගණන හා කළමනාකරන කමිටුව 2016 අගෝස්තු මස දී පත්කරන ලද අතර, නිසි බලධාරියා එහි ප්‍රධානත්වය දරනු ලැබීය. එය සාමාජිකයන් 03 දෙනෙකුගෙන් සමන්විත වූ අතර රැස්වීම් 05 ක් පවත්වනු ලැබීය. එහි සාමාජිකයන්ගේ වෙනත් වගකීම් සඳහා කිසිඳු රැස්වීමක් නොපවත්වන ලදී. කෙසේවුවත් විගණන හා කළමනාකරන කමිටු රැස්වීම් 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක වන අතර, රැස්වීම් 04 ක් පැවැත්වීමට නියමිතය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } අයිඑම්ශූ/ඊ/එල්එම්එස්එල්/1/16/ඒජ්ඊ  ඔබේ අංකය / உமது இல. / Your No. }  දිනය / திகதி / Date } 2018 පෙබරවාරි 07 දින.

සභාපති,

සීමාසහිත ලංකා මිනරල් සැන්ඩ්.

**සීමාසහිත ලංකා මිනරල් සැන්ඩ් ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.**

---

සීමාසහිත ලංකා මිනරල් සැන්ඩ් සමාගමේ ("සමාගම") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කරගෙන යාම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය")වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මතය ව්‍යාවනය සඳහා පදනම සඳහා වූ ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34  +94-11-2887223  oaggov@sltnet.lk  www.auditorgeneral.gov.lk

Auditor General's Department

**මතය ව්‍යාවනය සඳහා පදනම**

--------------------------------

(අ) 2011 නොවැම්බර් 09 දින කැබිනට් අමාත්‍යවරුන්ගේ තීරණය පරිදි සීමාසහිත රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත 2012 ජනවාරි 10 දින රු.500,000,000 ක් අත්තිකාරම් ලෙස සමාගම විසින් ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද මෙම අත්තිකාරම් සම්බන්ධයෙන් තුන්වන පාර්ශවයෙන් සනාථ කිරීම් මට ඉදිරිපත් නොවූ අතර වාර්තාකරන දිනය දක්වාම නැවත ගෙවීම් සිදුකර නොතිබුණි. තවද දෙපාර්ශවය විසින් ඇතිකර ගත් අවබෝධතා ගිවිසුමේ ( MOU) 5 වන වගන්තිය අනුව රු.500,000,000 ක් වූ අත්තිකාරම් නැවත ගෙවීමට අදාළ කොන්දේසි සහ ලැබිය යුතු රු.12,421,448 ක පොලිය සම්බන්ධයෙන් එහි ඇතුළත් කර නොතිබුණි. තවදුරටත් අවබෝධතා ගිවිසුමේ 6 වන වගන්තිය අනුව සීමාසහිත රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව විසින් ගෙවිය යුතු ණය සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය තුන්වන පාර්ශවයක් ලෙස නම් කර තිබුණි. කෙසේ වුවත් මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලැබෙනතුරු එම වගන්තිය වලංගු නොවුණි. ඉහත දැක්වූ කරුණු හේතුවෙන් රු.500,000,000 ක අත්තිකාරම් සහ ලැබිය යුතු රු.12,421,448 ක පොලිය අයකර ගැනීම අවිනිශ්චිත බැවින් හානිකරණයක් ඇත්නම් එය අගයකිරීම් හා හඳුනාගැනීම මූල්‍ය ප්‍රකාශන මගින් සිදුකර නොතිබුණි.

(ආ) (I) පෙර වර්ෂ දෙකේදී සහ සමාලෝචිත වර්ෂය තුළදී කළමනාකරණය විසින් හඳුනාගත් අමු වැලි තොගය (block A tailings) 2014 වර්ෂයට පෙර සාමාන්‍ය අපතය ලෙස රු.434,867,518 ක් ගිණුම් තබා තිබූ අතර අනාගත නිෂ්පාදන පිරිවැය සැළකිල්ලට ගෙන මෙහි වටිනාකම රු.434,867,518 ක් (2014 වර්ෂයේදී රු.159,562,130 ක්, 2015 වර්ෂයේදී රු.152,791,602 ක් 2016 වර්ෂයේදී රු.122,513,786 ක් වශයෙන්ද) ලෙස අගය කර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන ප්‍රතිශෝධනය කර තිබුණි. එසේ නමුත් වර්තමානයේ මෙම තොගය තවමත් අපිරිසිදු වැලි ලෙස පවතී. සමාගම විසින් මා වෙත ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තාවට අනුව, මෙම අමු තොගයේ ඛනිජ අඩංගු වී තිබුණේ සියයට 7.88 ක් පමණි. නමුත් වැලි ක්‍රියාවලියට නිර්මාණය කර ඇති වර්තමාන යන්ත්‍රෝපකරණ සඳහා අවම වශයෙන් සියයට 40 ක් ඛනිජ වැලි ඇතුළත් විය යුතුය. එමනිසා අමුවැලි තොගයෙහි අඩංගු ඛනිජ නිස්සාරණ කිරීම පිළිබඳව සමාගමේ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින අතර ඒ අනුව වර්ෂ අවසානයට එම තොග තක්සේරුව වරදවා දක්වා තිබුණි. තවදුරටත් අපතත අවම කිරීම සඳහා සමාගමේ ඉහළ කළමනාකරණය විසින් උපායමාර්ගික තීරණයක් ගෙන නොතිබූ බව විගණනයේදී

2

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

නිරීක්ෂණය විය. සමාගම විසින් ඉන්වෙන්ට්‍රි අගය ගැලපීම් කිරීම පදනම් කරගෙන එහි කාර්යමණ්ඩලයට රු. 1,815,896 ක දිරිදීමනා ගෙවා තිබුණි.

(ii) ඉහත තොග ගැලපීමේ ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ලාභය රු.122,513,786 කින් අධිගණනය වී තිබූ අතර මූල්‍ය ප්‍රකාශනවල මෙම ගැලපීම සිදුනොකළේ නම් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ලාභය රු.4,352,211 ක මෙහෙයුම් අලාභයක් විය හැකිව තිබුණි.

(ඇ) තොග අගය කිරීමේදී නොවිකුණු තොගයට අදාළ සෘජු අන්තර්ග්‍රහණ පිරිවැය සළකා නොතිබූ බව මම සටහන් කරන ලදී. සමාගම විසින් තොගය තක්සේරු කිරීම වෙනුවට විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ මෙහෙයුම් වියදම් යටතේ රු.305,270,258 ක අවශෝෂණ නොකරන ලද පොදුකාර්යය හඳුනාගෙන තිබුණි. මෙය ශ්‍රී ලංකා ගණකාධිකරණය ප්‍රමිත (LKAS) 02 (තොග) යටතේ වූ අවශ්‍යතාවයන්ට අනුකූල නොවූ අතර වර්ෂය අවසානයේ තොග අගය අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 (ආදායම්) හි අවශ්‍යතාවයන්ට අනුව ගැනුම්කරුට භාණ්ඩවල අයිතිය මාරුකිරීමේදී අවදානම් හා ප්‍රතිලාභ අනුව ආදායම් හඳුනාගත යුතුය. ගැනුම්කරු විසින් එකඟ වූ කොන්දේසි අනුව කර්මාන්තශාලාවෙන් භාණ්ඩ නිකුත් කරන අවස්ථාවේදී භාණ්ඩවල අයිතියට අදාළ අවදානම් හා ප්‍රතිලාභ ගැනුම්කරුට මාරුවිය යුතුය. එසේ වුවත් නෞභාර පත්‍රය ලැබීමෙන් පසු වාණිජ ඉන්වොයිසිය ලියන අවස්ථාවේදී සමාගම විසින් ආදායම් හඳුනාගන්නා බව නිරීක්ෂණය විය. එබැවින් වැරදි යෙදීම් කපාහැරීම හේතුවෙන් ආදායම් හඳුනාගැනීමේ ප්‍රමාදයන් පවතී. කපාහැරීම් පරීක්ෂණය ඉටුකිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන් මට සපයා නොතිබීම නිසා වරදවා දැක්වීම්වල බලපෑම ප්‍රමාණනය කිරීමට මට නොහැකි විය.

මතය ව්‍යාවනය

------------------

මතය ව්‍යාවනය සඳහා පදනම් සඳහා වූ ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

3

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

**වෙනත් නෛතික නියාමන කරුණු පිළිබඳව වාර්තාව**

-----------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය මගින් නියම කර ඇති පරිදි පහත සඳහන් කරුණු ගෙන හැර දක්වමි.

(අ) විගණන මතයේ පදනම, විෂය පථය හා විගණනයේ සීමා කිරීම ඉහත සඳහන් පරිදි විය.

(ආ) මාගේ විගණන මතය අනුව,
විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම ම විසින් ලබාගෙන නැති බව ඉහතින් දක්වා ඇති අතර ඒ නිසා මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් මතයක් ප්‍රකාශ නොකරමි.

**පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම**

----------------------------------------

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අ/භා. එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති.

4

# විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| **දළ පිරිවැටුම** | 3 | 1,173,915,676 | 1,688,079,113 |
| එකතු කල අගය මත බද්ද | | (326,289) | (184,815) |
| **ශුද්ධ පිරිවැටුම** | | 1,173,589,387 | 1,687,894,298 |
| විකුණුම් පිරිවැය | 4 | (566,332,585) | (866,415,748) |
| **දළ ලාභය** | | 607,256,802 | 821,478,550 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 5 | 3,083,602 | 65,927,211 |
| | | 610,340,404 | 887,405,761 |
| බෙදාහැරීමේ වියදම් | 6 | (6,633,016) | (14,163,023) |
| පරිපාලන වියදම් | 7 | (170,221,121) | (163,079,380) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 8 | (315,324,692) | (277,045,734) |
| | | (492,178,829) | (454,288,137) |
| **මෙහෙයුම් ලාභය** | | 118,161,575 | 433,117,624 |
| මූල්‍ය ආදායම් | 9 | 52,337,064 | 69,636,884 |
| **වර්ෂයේ බදු වලට පෙර ලාභය** | | 170,498,639 | 502,754,508 |
| ආදායම් බදු වියදම | 10 | (16,360,033) | (45,984,819) |
| **වර්ෂයේ බදු පසු ලාභය** | | 154,138,606 | 456,769,689 |
| **වර්ෂයේ ශුද්ධ ලාභය** | | 154,138,606 | 456,769,689 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්**<br>(පසු කාලීනව ලාභ හා අලාභ වලට නැවත වර්ගීකරණය නොකරන අයිතම) | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැරකම් මත ශුද්ධ ආයු ගණන ලාභය/(අලාභය) | | 2,859,003 | (3,873,677) |
| **වර්ෂය සඳහා මුළු විස්තර ආදායම්** | | 156,997,609 | 452,896,012 |
| **කොටසක සාමාන්‍ය ඉපයීම** | 11 | 1.93 | 5.71 |

01 සිට 39 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය අංගයක් වේ.

# මූල්‍ය තත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 12 | 758,802,341 | 779,562,362 |
| කල්බදු ඉඩම් | 13 | 21,645,046 | 22,476,452 |
| අස්පෘශ්‍ය වත්කම් | 14 | 357,054 | 258,250 |
| අත්තිකාරම් | 15 | 557,421,448 | 554,921,448 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 1,338,225,889 | 1,357,218,512 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 16 | 948,590,005 | 800,158,127 |
| කෙටිකාලීන මූල්‍ය වත්කම් | 17 | 18,981,226 | 208,640,110 |
| ස්ථාවර තැන්පතු | 18 | 365,313,874 | ------- |
| අත්තිකාරම් සහ තැන්පතු | 19 | 46,955,953 | 14,414,611 |
| කලින් ගෙවූ වියදම් | 20 | 32,618,903 | 35,444,787 |
| වෙනත් ලැබිය යුතු දෑ | 21 | 302,938,689 | --------- |
| ලැබිය යුතු ආදායම් බදු | 22 | 20,918,976 | 330,084,215 |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 23 | 25,353,081 | 18,457,054 |
| **මුළු ජංගම වත්කම්** | | 1,761,670,707 | 1,407,198,904 |
| **මුළු වත්කම්** | | 3,099,896,596 | 2,764,417,416 |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ස්කන්ධය** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 24 | 800,000,000 | 800,000,000 |
| වෙනත් සංචිත | 25 | 906,544,343 | 1,017,544,343 |
| රඳවාගත් ඉපයීම් / (අලාභ) | 26 | 837,317,294 | 458,024,737 |
| **කොටස් හිමියන්ගේ මුළු හිමිකම** | | 2,543,861,637 | 2,275,569,080 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම පාරිතෝෂික බැඳීම | 27 | 58,424,744 | 63,551,328 |
| විලම්භිත බදු | 28 | 48,460,989 | 32,100,956 |
| ගෙවිය යුතු ආදායම් බදු | 29 | --------- | 6,096,184 |
| | | 106,885,733 | 101,748,468 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ණය හිමියෝ | 30 | 404,937,520 | 306,930,104 |
| වෙන්කිරීම් හා උපචිත වියදම් | 31 | 44,211,706 | 80,169,764 |
| කෙටිකාලීන ණය | 32 | ---------- | ---------- |
| **මුළු වගකීම්** | | 449,149,226 | 387,099,868 |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | 556,034,959 | 488,848,336 |

සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූල බව මම සහතික කරමි.

අත්සන් කලේ – ඩබ්ලිව්.කේ.තමාරා - ප්‍රධාන මූල්‍ය නිළධාරි

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබනු ලැබුවේ

අත්සන් කලේ - එම්. ගුණරත්න - නිසි බලධාරියා

දිනය - 24 ඔක්තෝබර්, 2017

01 සිට 39 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය අංගයක් වේ.

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශණය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

( ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතයි)

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපයීම්/(අලාභ) | මුහුදු යාත්‍රා රක්ෂණ නිදන් අරමුදල් සංචිතය | යන්ත්‍ර හා පිරියත ප්‍රතිස්ථාපනය හා වැඩි දියුණු කිරීමේ නිදන් අරමුදල් සංචිතය | ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි නිදන් අරමුදල් සංචිතය | සුනාමි අළුත්වැඩියා නිදන් අරමුදල් සංචිතය | සේවක වන්දි නිදන් අරමුදල් සංචිතය | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|---|
| 2015 ජනවාරි 01 දිනට ශේෂය | 800,000,000 | 206,233,360 | 111,000,000 | 706,346,960 | 171,149,672 | 18,801,474 | 10,246,237 | 2,023,777,703 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | ------- | 587,233,348 | ------- | ------- | ------- | ------- | ------- | 587,233,348 |
| වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම | ------- | (3,873,677) | ------ | ------- | ------- | ------- | ------- | (3,873,677) |
| භාණ්ඩාගාරයට ලාභාංශ | | (158,500,000) | | | | | | (158,500,000) |
| 2015.12.31 දිනට ශේෂය | 800,000,000 | 631,093,031 | 111,000,000 | 706,346,960 | 171,149,672 | 18,801,474 | 10,246,237 | 2,448,637,374 |
| **2016.01.01 දිනට ශේෂය** | 800,000,000 | 631,093,031 | 111,000,000 | 706,346,960 | 171,149,672 | 18,801,474 | 10,246,237 | 2,448,637,374 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | ------- | 154,138,606 | ------- | ------- | ------- | ------- | ------- | 154,138,606 |
| වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරන ආදායම | ------- | 2,859,003 | ------- | ------- | ------- | ------- | ------- | 2,859,003 |
| මුහුදු යාත්‍රා රක්ෂණ නිදන් අරමුදල් ගැලපීම් | ------- | 111,000,000 | (111,000,000) | ------- | ------- | ------- | ------- | ------ |
| රඳවාගත් බදු ගැලපීම් | ------- | 163,066 | ------- | ------- | ------- | ------- | ------- | 163,066 |
| 2015/2016 වර්ෂය සඳහා ඌන ආදායම් බදු | ------- | (7,988,412) | ------- | ------- | ------- | ------- | ------- | (7,988,412) |
| භාණ්ඩාගාරයට ලාභාංශ | ------- | (53,948,000) | ------- | ------- | ------- | ------- | ------- | (53,948,000) |
| 2016.12.31 දිනට ශේෂය | 800,000,000 | 837,317,294 | --------- | 706,346,960 | 171,149,672 | 18,801,474 | 10,246,237 | 2,543,861,637 |

01 සිට 39 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන මෙම මුල්‍ය ප්‍රකාශන වල වැදගත්ම කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | 2016 රු | 2015 රු |
|---|---|---|
| **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | |
| **බදු පෙර ලාභය/(අලාභය)** | **170,498,639** | **502,754,508** |
| **ගැලපීම්;** | | |
| ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය | 75,839,656 | 76,021,456 |
| පොළී ආදායම් | (52,337,064) | (69,636,884) |
| පාරිතෝෂික | 11,708,997 | 10,517,230 |
| පෙර වසරේ ගැලපීම් | (256,203) | (234,357) |
| විශ්‍රාම පාරිතෝෂික ආයුගණන අලාභය | ------ | --------- |
| දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභ | (1,025,093) | (1,977,103) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය** | **204,428,932** | **517,444,849** |
| තොගවල (වැඩිවීම්)/අඩුවීම් | 28,441,335 | 160,600,261 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම්)/අඩුවීම් | (244,804,859) | (13,533,799) |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම්/(අඩුවීම්) | 62,049,358 | (454,821,613) |
| ණය පහසුකම්වල වැඩිවීම්/(අඩුවීම්) | --------- | (72,797,811) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල්** | **50,114,766** | **136,891,887** |
| ගෙවූ පාරිතෝෂික | (13,720,373) | (13,187,595) |
| ගෙවූ ආදායම් බදු | (30,893,654) | (5,748,387) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **5,500,739** | **117,955,906** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| ආයෝජන සඳහා කළ තැන්පත් කිරීම් | 114,113,335 | 151,929,023 |
| පොළී ආදායම | (52,337,064) | 69,636,884 |
| නොනිම් ප්‍රාග්ධන වැඩ | (52,106,097) | (192,226,654) |
| ඉඩම්, දේපළ,පිරියත හා උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | (4,568,344) | (148,648,727) |
| දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීම් වලින් ලද මුදල් | 1,794,197 | 2,041,434 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **6,896,027** | **(117,268,040)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| ගෙවූ ලාභාංශ | --------- | (14,000,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | --------- | (14,000,000) |
| | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | **6,896,027** | **(13,312,134)** |
| **වර්ෂය ආරම්භයේ තිබූ මුදල් හා මුදල් වලට සමාන දෑ** | 18,457,054 | 31,769,187 |
| **වර්ෂය අවසානයේ තිබූ මුදල් හා මුදල් වලට සමාන දෑ** | 25,353,081 | 18,457,054 |
| | | |
| **මුදල් හා මුදල් වලට සමාන දෑ විශ්ලේෂණය** | | |
| බැංකුවේ ඇති මුදල් | 25,178,229 | 18,275,903 |
| අතැති මුදල් | 154,852 | 161,151 |
| සුළු මුදල් | 20,000 | 20,000 |
| | 25,353,081 | 18,457,054 |

01 සිට 39 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය අංගයක් වේ.

# මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## 1. ආයතනික තොරතුරු

### 1.1 පොදු

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජයට අයත් ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද සීමාසහිත වගකීමක් ඇති සමාගමකි. එහි ලියාපදිංචි කාර්යාලය, අංක 341/21, සරණ මාවත, රාජගිරිය හි පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

සමාගමේ ප්‍රධානතම කාර්යය වනුයේ බර ඛණිජ වැලි කැණීම, සැකසීම සහ අලෙවිකරණයයි.

### 1.3 සමාගමේ සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානයේ දී සමාගමේ සේවක සංඛ්‍යාව 685 ක් විය. (2015 වර්ෂයේ සේවක සංඛ්‍යාව 847 කි.)

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 2.1 සැකසීමේ පදනම

ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්හි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති - SLFRSs) වලට අනුකූල වන ලෙස පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRSs) වලට අනුකූලව පිළියෙල කිරීමේ දී නිශ්චිත තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. ඒ සමඟ ම කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යොදාගැනීමේ දී ඔවුන්ගේ විනිශ්චයන්ද මේ සඳහා පාදක කරගනී. ඉහළ මට්ටමක සංකීර්ණතාවන් සහිත ඇස්තමේන්තු හෝ මූල්‍ය ප්‍රකාශන වලට වැදගත් වන උප කල්පන හා ඇස්තමේන්තු සහිත ස්ථානයක් සටහන් 2 A න් අනාවරණය කොට ඇත. 2017 ඔක්තෝම්බර් මස 24 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර ලබාදෙන ලදී.

### 2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්කම්

අදාළ වන විටදී, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා සහ වත්මන් වර්ෂය සමඟ සංසන්ධනාත්මක විය යුතු අවස්ථාවලදී පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීම, සංශෝධනය කොට ඇත.

## 2.3 විදේශ මුදල් පරිවර්තනය

### 2.3.1 ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරී ව්‍යවහාර මුදල්

ආයතනය ක්‍රියාත්මක වන්නා වූ මූලික ආර්ථික පරිසරයට අදාළ වලංගු මුදල් භාවිතා කර මෙම මූල්‍ය වාර්තා වල අඩංගු ගණුදෙනු හා ශේෂයන් වාර්තාකරණය කර ඇත. සමාගමේ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් (LKR) භාවිතා කර මෙම මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

### 2.3.2 ගනුදෙනු හා ශේෂයන්

ගනුදෙනුව සිදුවන දිනයේ පැවති විනිමය අනුපාතිකය පදනම් කරගෙන විදේශීය මුදලින් සිදුවූ ගනුදෙනු ක්‍රියාකාරි මුදල් ඒකකයට පරිවර්තනය කරන ලදී. විදේශ විනිමය තුළින් ප්‍රකාශිත මූල්‍ය වත්කම් හා බැරකම් වර්ෂ අවසාන දිනට ඇති විනිමය අනුපාතයට පරිවර්තනය කිරීමෙන් සහ එවැනි ගනුදෙනුවන් පියවීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන විනිමය ලාභ හා අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ දක්වා ඇත.

## 2.4 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ මූලිකව හඳුනාගෙන ඇත්තේ එම වත්කම් සමාගමේ කළමනාකරණය බලාපොරොත්තු වන පරිදි භාවිතා කල හැකි තත්වය දක්වා ගෙන ඒමට කරන ලද ඍජු වියදම් ද සහිතව පිරිවැයට සටහන් කර ඇත.

දේපළ, පිරියත හා උපකරණ පසුකාලීනව පිරිවැයෙන් එහි සමුච්චිත ක්ෂය හා හානිකරන අලාභ අඩුකල පසු අගයට ගණනය කර ඇත.

පසුකාලීන පිරිවැය වත්කමේ ධාරණ අගයට එකතු කිරීම හෝ වත්කමක් ලෙස හඳුනාගනුයේ එයින් ජනනය වන ප්‍රතිලාභ සමාගම තුලට ගලා එන්නේ නම් සහ අයිතමයේ පිරිවැය විශ්වසදායි ලෙස මැනිය හැකි විටදී පමණයි.

අනෙකුත් සියළු අළුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම් සඳහා දරන වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි අදාල කාල පරිච්ඡේදයට අයත් වියදමක් ලෙස සලකනු ලබයි.

ඉඩම් ක්ෂය නොකරයි. අනෙකුත් වත්කම් සරළ මාර්ග ක්ෂය ක්‍රමයට ගණනය කරන ලද ක්ෂය පහත දැක්වෙන පරිදි එහි තක්සේරු කරන ලද ජීවිත කාලය පුරා වෙන් කරනු ලබයි.

| | | |
|---|---|---|
| වැඩබිම් සංවර්ධනය | අවුරුදු 20 | 5% |
| ගොඩනැගිලි | අවුරුදු 20 | 5% |
| යන්ත්‍රෝපකරණ හා පිරියත | අවුරුදු 10 | 10% |
| ලිහිල් මෙවලම් හා උපකරණ | අවුරුදු 10 | 10% |
| ලී බඩු, සවිකිරීම් හා උපකරණ | අවුරුදු 10 | 10% |
| මෝටර් රථ | අවුරුදු 5 සිට 6.5 දක්වා | 15% - 20% |

| | | |
|---|---|---|
| ජල සැපයුම් | අවුරුදු 10 | 10% |
| මුහුදු යාත්‍රා | අවුරුදු 10 | 10% |
| ගොහොරු පතල් | අවුරුදු 4 | 25% |
| පරිගණක දෘඩාංග | අවුරුදු 4 | 25% |

වත්කමක ඇස්තමේන්තුගත නැවත අයකරගත හැකි වටිනාකමට වඩා එහි ධාරණ අගය වැඩි වන අවස්ථාවක, වත්කමේ ධාරණ අගය අයකර ගත හැකි අගය දක්වා වහාම කපාහරිනු ලැබේ.

## 2.5 අස්පෘශ්‍ය වත්කම්

විශේෂිත පරිගණක මෘදුකාංග හා පද්ධති අත්පත් කරගැනීමට සහ භාවිතයට සුදුසු තත්වයට ගෙන ඒමට දරන පිරිවැය මත පදනම්ව, අත්පත් කරගත් පරිගණක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති ප්‍රාග්ධනීත කර ඇත. අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම්, පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකල අගයට දක්වා තිබේ. මෙම පිරිවැයන් පහත දැක්වෙන පරිදි තක්සේරු කරන ලද ජීවිත කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | අවුරුදු 4 | 25% |

පරිගණක මෘදුකාංග වැඩ සටහන් නඩත්තු කිරීම ආශ්‍රිත පිරිවැය වියදමක් ලෙස සලකනු ලබයි.

## 2.6 මූල්‍ය නොවන වත්කම් අපහායනය

සමාගම විසින් සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේ දී එහි දේපළ, පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් හි යම්කිසි අපහායනයක් සිදුවී තිබේද නැද්ද යන්න පිළිබඳ නිර්ණය කිරීම සඳහ එම වත්කම්හි ධාරණ අගයන් පිළිබඳව පරීක්ෂාවන කරයි. කිසියම් එවැනි ඇඟවීම් පවතින්නේ නම්, අපහායන අලාභයේ ප්‍රමාණය (පවතී නම්) නිර්ණය කිරීම සඳහා වත්කමේ නැවත අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කරයි. තනි තනි වත්කම් හි නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කල නොහැකි අවස්ථාවන් හිදී, සමාගම මූල්‍ය උත්පාදන ඒකකය නිර්ණය කරන අතර එම වත්කම අයත් වන මූලූ උත්පාදන ඒකකයේ නැවත අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කරයි.

නැවත අයකරගත හැකි අගය වන්නේ, ධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩුකල පසු ලැබෙන අගය සහ භාවිතයෙන් ලැබෙන වටිනාකමෙහි වඩා වැඩි අගයයි. භාවිතයෙන් ලැබෙන වටිනාකම අගය කිරීමේ දී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් එහි වර්තමාන අගයන් ලබාගැනීමට වට්ටම් කළයුතු අතර, එහිදී බදු පෙර වට්ටම් අනුපාතිකය භාවිතා කළයුතුය. එම වට්ටම් අනුපාතිකය වර්තමාන වෙළඳපලෙහි මුදල් සඳහා ඇති කාල අගයත් අදාල වත්කම් සඳහා වන නිශ්චිත අවදානමත් සැලකීමකින් හෝ ගැලපීමකින් තොරව ඇස්තමේන්තු කළ යුතුය.

වත්කමක (හෝ මුදල් උපදන ඒකකයක) නැවත අයකරගත හැකි අගය එහි වර්තමාන අගයට වඩා අඩුවෙන් ඇස්තමේන්තු ගත වුවහොත් වත්කමේ ධාරණ අගය (ගෙවූ මුදල් උත්පාදන ඒකකයක) එහි නැවත අයකරගත හැකි අගය දක්වා අඩුකල යුතුය. අපහායන අලාභයන් වහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ගැලපීම් කල යුතුය.

## 2.7 මූල්‍ය වත්කම්

### 2.7.1 වර්ගීකරණය

සමාගම තම මූල්‍ය වත්කම් මූලික හඳුනාගැනීමේදී ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කිරීම පහත පරිදි තීරණය කර ඇත.

#### ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු ව්‍යුත්පන්න කල නොහැකි, ස්ථිර හෝ නිශ්චිත වු ගෙවීම් වලින් යුක්ත වන සක්‍රිය වෙළෙඳ පොළ තුල ලැයිස්තුගත නොවු මූල්‍ය වත්කම් වේ. මේ තුල අන්තර්ගත වනුයේ ජංගම වත්කම් වන අතර ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන, කල් පිරීමේ කාලය මාස 12 ඉක්මවන මූල්‍ය වත්කම් අදාල වනුයේ නැත. සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ යන්නට වර්ෂය අවසාන දිනට ඇති වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ, නැවත මිලදී ගත හැකි රාජ්‍ය බැඳුම්කර, රජයේ තාවකාලික අතිරික්ත අරමුදල් වල කර ඇති ආයෝජන, කලින් ගෙවීම්, තැන්පතු, සේවකයන්ට දුන් ණය, මුදල් හා මුදල් සමාන දෑ අඩංගු වේ.

### 2.7.2 හඳුනාගැනීම හා මුල්වරට අගය කිරීම

ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම් මුල් වරට හඳුනා ගත යුත්තේ ආයතනය විසින් ගණුදෙනුව මුල් වරට උත්පාදනය කල දිනයේය. මූල්‍ය වත්කමක් මුල් වරට අගය කල යුත්තේ සාධාරණ අගයට, සෘජුවම අදාල කළහැකි පිරිවැයක් එකතු කිරීමෙනි.

මූල්‍ය වත්කම් හඳුනාගැනීම නවතා දැමිය යුත්තේ මූල්‍ය වත්කමකින් අරමුදල් ගලා ඒමේ අයිතිය කල් පිරුණු විටකදී හෝ එය වෙනත් පාර්ශවයකට මාරු කල විටකදී හා සමාගම මූල්‍ය වත්කමේ අයිතිය මත ඇති ප්‍රමාණාත්මක අවදානම් හා ප්‍රතිලාභ මාරු කළ විටදීය.

### 2.7.3 පසුකාලීනව සිදුකරනු ලබන අගය කිරීම

ණය සහ ලැබිය යුතු දෑ පසුකාලීනව අගය කල යුත්තේ සඵලදායී පොළී අනුපාතයට ගණනය කල ක්‍රමක්ෂය වු පිරිවැයෙන් අපහායනය සඳහා වු වෙන්කිරීම් අඩුකල පසු අගයටයි.

### 2.7.4 මූල්‍ය වත්කම් අපහායනය කිරීම

#### ක්‍රමක්ෂය වූ පිරිවැය මත පවත්වාගෙන යනු ලබන වත්කම්

සමාගම සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේදීම තම මූල්‍ය වත්කම් හානිකරණයට ලක් වී ඇති බවට ප්‍රමාණාත්මක සාක්ෂි තිබේ ද නැද්ද යන්න විමසා බැලිය යුතුය. මූල්‍ය වත්කමක් අපහායනය කිරීම සහ එම අපහායන අලාභය දැරිය යුත්තේ, මුල්වරට හඳුනාගැනීමෙන් පසු ඇති වූ එක් හේතුවක් (සිදුවීමක්) හෝ හේතු කිහිපයක් නිසා අපහායනය වූ බවට ප්‍රමාණාත්මක සාක්ෂි ඇත්නම් පමණක් හා එම අලාභ සිදුවීමෙන් අනාගත මූල්‍ය ප්‍රවාහයන් මත ඇති වන්නා වූ බලපෑම විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කලහැකි නම් පමණි.

ක්‍රමක්ෂය වූ පිරිවැය මත පවත්වාගෙන යනු ලබන ණය සහ ලැබිය යුතු දෑ වල අපහායන අලාභය හඳුනාගත යුත්තේ වත්කම පවත්වාගෙන යන අගය හා එම වත්කමේ අනාගත මුදල් ප්‍රවාහයන් සඵලදායි පොළී අනුපාතය මත වට්ටම් කල පසු අගය අතර ඇති වෙනසයි. (අනාගත මුදල් ප්‍රවාහයන් සැලකීමේ දී දරනු නොලබන අනාගත අපේක්ෂිත අලාභ අයත් නොවේ.) වත්කමේ පවත්වාගෙන යනු ලබන අගය අඩුකල යුතු අතර අලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගත යුතුය.

යම් හෙයකින්, පසු කාලපරිච්ඡේදයකදී, හඳුනාගත් අපහායන අලාභය අඩු වුවහොත් සහ එම අඩුවීම අපහායනය හඳුනාගත් පසු ඇතිවූ කිසියම් සිදුවීමකට අදාල කල හැකිනම් කලින් හඳුනාගත් අපහායන අලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ යලි ප්‍රත්‍යාවර්තනය කරයි.

### 2.8 තොග

තොග අගය ප්‍රකාශයට පත් කරනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් වලින් අඩු අගයටයි. පිරිවැය හඳුනාගනුයේ බර තැබූ සාමාන්‍ය පිරිවැය අගය මත පදනම්වය. ශුද්ධ උපලබ්ධි අගය ඉදිරිපත් කර ඇත්තේ තොගයෙහි ඇස්තමේස්තු ගත විකුණුම් මිළෙන් විකිණීම සම්පූර්ණ කිරීම සඳහා වන පිරිවැය හා විකිණීම සඳහා අත්‍යවශ්‍ය වන ඇස්තමේන්තු ගත පිරිවැය අඩු කිරීමෙනි.

### 2.9 වෙළෙඳ ලැබිය යුතු දෑ

වෙළෙඳ ලැබිය යුතු දෑ යනුවෙන් අදහස් කරනුයේ ආයතනයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලින් ඇති වූ භාණ්ඩ විකුණුම් සඳහා පාරිභෝගිකයින් / ගැණුම්කරුවන්ගෙන් ලැබිය යුතු මුදල් වේ. ව්‍යාපාරයේ සාමාන්‍ය ව්‍යාපාරික චක්‍රය තුලදී එකතු කර ගැනීමට බලාපොරොත්තු වන අතර ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

වෙළෙඳ වත්කම් මුල්වරට හඳුනාගත යුත්තේ සාධාරණ අගය නැතහොත් ලදුපත් අගය මත වන අතර, පසුකාලීනව අගය කල යුත්තේ මුදලේ කාල වටිනාකමේ වැදගත් බලපෑමක් ඇති නොවන්නා වූ, කෙටි කාලයකදී ලබා ගැනීමට බලාපොරොත්තු වන සත්‍ය ලදුපත් අගයෙන් අපහායනය සඳහා වන වෙන්කිරීම් අඩුකල පසු අගයටයි.

සමාගම සෑම ගිණුම් කාලපරිච්ඡේදයක් අවසානයේදීම තම වෙළෙඳ ලැබිය යුතු දෑ අපහානය වී ඇති බවට පැහැදිලි සාක්ෂි පවතීද නැද්ද යන්න විමසා බැලිය යුතුය. වෙළෙඳ ලැබිය යුතු දෑ සඳහා වූ අපහායන සාක්ෂි තුල මුදල් එකතු කර ගැනීම සම්බන්ධව ආයතනයේ අතීත අත්දැකීම්, නැතහොත් විලම්භිත ගෙවීම් වල වැඩිවීමක් ඇතුලත් විය හැක. වෙළෙඳ ලැබිය යුතු දෑ අපහායනය වීම හා එම අපහායනය දැරිය යුත්තේ අපහායනය වූ බවට පැහැදිලි සාක්ෂි ඇත්නම් පමණි.

## 2.10 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල මුදල් හා මුදල් සමාන දෑ යන්න තුල අන්තර්ගත වනුයේ අතැති මුදල්, බැංකුවේ ඇති ඉල්ලුම් තැන්පතු, සත්‍ය කල්පිරීමේ කාලය මාස තුනක් හෝ ඊට අඩු ඉහල ද්‍රවශීලතාවයකින් යුතු වෙනත් කෙටිකාලීන ආයෝජනයන්ය.

## 2.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය

ප්‍රකාශිත ප්‍රාග්ධනය තුල නිරූපණය වනුයේ නිකුත් කල කොටස් හි අගය වේ. " සාමාන්‍ය කොටස් " හිමිකම් ලෙස වර්ගීකරණය කර ඇත.

## 2.12 මූල්‍ය වගකීම්

සමාගම මූල්‍ය වගකීම් වෙනත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ. සමාගමේ වෙනත් මූල්‍ය වගකීම් තුල අන්තර්ගත වනුයේ වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ය. වෙනත් මූල්‍ය වගකීම් මුල්වරට හඳුනාගනුයේ සාධාරණ අගය හා සෘජුවම අය කල හැකි පිරිවැය යන අගයන්ගේ එකතුවටය. මුල්වරට හඳුනාගැනීමෙන් පසු, මෙම මූල්‍ය වගකීම් අගය කර ඇත්තේ කෙටි කාලයක් තුල පියවා දැමීමට බලාපොරොත්තු වන, මුදලේ කාල වටිනාකමේ වැදගත් බලපෑමක් නොවන්නා වූ, සත්‍ය ලදුපත් අගය මතය.

සමාගම මූල්‍ය වගකීම් හඳුනා ගැනීම නවතා දමනුයේ ගිවිසුම් ගත වගකීම් විසර්ජනය කිරීමකදී, අවලංගු කිරීමකදී හෝ කල් පිරීමකදීය.

## 2.13 වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ යනු ආයතනයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී සැපයුම්කරුවන්ගෙන් අත්පත් කරගත් භාණ්ඩ හා සේවා සඳහා ගෙවීමට ඇති බැඳියාවයි. වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ ඒවා ආයතනයේ සාමාන්‍ය ව්‍යාපාරික චක්‍රය තුල සිදුවන බැවිනි.

වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ මුල්වරට හඳුනාගත යුත්තේ සාධාරණ අගය නැතහොත් ගණුදෙනු වන මිල මත වන අතර පසුකාලීනව අගය කල යුත්තේ මුදලේ කාල වටිනාකමේ වැදගත් බලපෑමක් නොවන්නාවූ, කෙටිකාලයක් තුල පියවා දැමීමට බලාපොරොත්තු වන සත්‍ය ලදුපත් අගය මතය.

## 2.14 ජංගම හා විලම්භිත බදු

කාලපරිච්ඡේදය සඳහා වූ බදු වියදම තුල අන්තර්ගත වනුයේ ජංගම හා විලම්භිත බදු වේ. වෙනත් විස්තීර්ණ ආදායම් සඳහා අදාල වන්නා වූ අයිතමයන් හැරුන කොට, බදු වියදම සමාගමේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගෙන ඇත. මෙහිදී වෙනත් විස්තීර්ණ ආදායම් තුලද බදු හඳුනාගෙන ඇත.

කාලපරිච්ඡේදය සඳහා අදාල වන්නා වූ ජංගම ආදායම් බද්ද ගණනය කොට ඇත්තේ කාලපරිච්ඡේදය අවසානයේ බල පවත්නා, සමාගමට අදාළ වන්නාවූ බදු නීතිය මත පදනම්වය. කළමනාකරණය විසින් බදු පාලනාධිකාරිය වෙත ගෙවීමට බලාපොරොත්තු වන අගය මත පදනම්ව, සුදුසු තැන්හිදී වෙන්කිරීම් සිදුකර ඇත.

මූල්‍ය ප්‍රකාශන තුල විලම්භිත බදු හඳුනාගෙන ඇත්තේ වත්කම් හා වගකීම් සඳහා වන බදු පදනම මත සහ ඒවා පවත්වාගෙන යන ධාරණ අගය අතර ඇති වන්නාවූ තාවකාලික වෙනස්කම් මත පදනම්වයි. ව්‍යාපාර ඒකාබද්ධ වීමේදී, එම ගණුදෙනුවෙන් ගිණුම්කරණ හෝ බදු අයවන ලාභය හෝ අලාභය මත වන බලපෑම හැරුණු කොට මුල්වරට හඳුනාගන්නා වත්කම් හා වගකීම් සඳහා විලම්භිත බදු ගණනය කර නැත. විලම්භිත බදු තීරණය කිරීම සඳහා කාලපරිච්ඡේදයේ අවසාන දිනට බලපවත්නා බදු අනුපාතයන් සැලකිල්ලට ගෙන ඇති අතර විලම්භිත බදු අදාල වන්නා වූ බදු වත්කම හඳුනාගැනීමේ දී හෝ විලම්භිත ආදායම් බදු වගකීම පියවීමේ දී අදාල කරගැනීමට බලාපොරොත්තු වේ.

විලම්භිත බදු වත්කම් හඳුනාගනුයේ එම අනාගත බදු අයකල හැකි ලාභය තාවකාලික වෙනස් කමට එරෙහිව ලබාගත හැකි බව ප්‍රත්‍යක්‍ෂ වන ප්‍රමාණය දක්වා පමණි.

විලම්භිත බදු හිලව් කිරීමක් සිදුකර කරනුයේ ජංගම බදු වත්කම් වලට එරෙහිව ජංගම බදු වගකීම් හිලව් කිරීම සඳහා නෛතිකමය වශයෙන් බල ගැන්වුනු හිමිකමක් ඇත්නම් පමණක් සහ ආදායම් බදු සඳහා අදාල වන්නා වූ විලම්භිත බදු වත්කම් හා වගකීම් පැනවීම එකම බදු අධිකාරියක් විසින් සිදු කරන්නේ නම් පමණි.

## 2.15 සේවක ප්‍රතිලාභ

ආයතනය සතුව නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හා නිශ්චිත දායකත්ව සැලසුම් යන සේවක ප්‍රතිලාභ සැලසුම් ඇත.

### 2.15.1 නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම් වූ කලී සමාගම විසින්, වෙනත් ආයතනයක් සඳහා නිශ්චිත දායක මුදලක් ගෙවනු ලබන පශ්චාත් සේවක ප්‍රතිලාභ අරමුදලකි. තවදුරටත් පවත්නා වූ දායක ගෙවීමක් සඳහා ආයතනය සතුව පවත්නා වූ නෛතික හෝ ගිවිසුම් ගත බැඳීමක් නොමැත. දායකයන්, සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනාගනු ලබන්නේ ඒවා ගෙවිය යුතු නම් පමණි.

සමාගම විසින් සේවකයාගේ දළ පාරිශ්‍රමිකයෙන් 12% සේවක අර්ථසාධක අරමුදල වෙතටත් (EPF), 3% සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (ETF) වෙතටත් දායක වනු ලබයි.

### 2.15.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධව ආයතනයේ වගකීම වනුයේ කාලපරිච්ඡේදය අවසානයේ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හි වර්තමාන අගය වේ. වාර්ෂිකව මෙහි අගය කිරීම සිදු කරනු ලබන්නේ පුරෝකථනය කල ඒකක බැර ක්‍රමය භාවිතා කොට ගෙනය.

